# එක්සේසත් රාජ්‍යයෙහි සංස්කෘතික අනුශාසකත්වය

අද ලෝකයේ විධායක, ව්‍යවස්ථාදායක, අධිකරණ යනුවෙන් බලය වෙන්කිරීමක් ගැන කියැවෙයි. මේ ආයතන තුන ම අපට දේශපාලන ආධිපත්‍යය ක්‍රියාත්මක කරන ආයතන ලෙස නම්කළ හැකි ය. මෙයට අමතර ව අප කතාකරමින් සිටින ආර්ථික, හා සංස්කෘතික ආධිපත්‍යය වෙයි. රාජ්‍යයක ආර්ථික ප්‍රතිපත්තිය තීරණය කරන්නේ කවු ද හා සංස්කෘතිය සම්බන්ධයෙන් නායකත්වය දරන්නේ කවු ද යන ප්‍රශ්න එහි දී මතුවෙයි.

වත්මන් බටහිර රටවල ආර්ථිකය ද සංස්කෘතිය ද තීරණය වන්නේ දේශපාලන ආධිපත්‍යයට යටත්ව ය. ආර්ථික ප්‍රතිපත්ති තීරණය කිරීම ආණ්ඩුවේ කටයුත්තක් වෙයි. වෙනත් වචනවලින් කිවහොත් අමාත්‍ය මණ්ඩලය හා ජනරජයක නම් ජනාධිපතිතුමන් විසින් ඒ තීරණය කෙරෙයි. රටේ ආර්ථික ප්‍රතිපත්ති තීරණය කිරීමෙන් පසුව විවිධ දෙපාර්තමේන්තු මගින් ඒ ක්‍රියාත්මක කෙරෙයි.

සංස්කෘතික ආධිපත්‍යය එයට වඩා සංකීර්ණ වෙයි. එහි දී ප්‍රධාන කාර්යයක් පාසල් හා විශ්වවිද්‍යාල මගින් සිදුකෙරෙයි. එමෙන් ම ආගමික මධ්‍යස්ථාන ඔස්සේ ද ඒ පාලනය වෙයි. අද වන විට ජනමාධ්‍ය මගින් ද සංස්කෘතිය හැසිරවෙයි. විශේෂයෙන් ම විද්‍යුත් ජනමාධ්‍ය හා එයින් ද රූපවාහිනී මාධ්‍ය ඔස්සේ සංස්කෘතික ආධිපත්‍යය පතුරවනු දක්නට ලැබිය හැකි ය. එසේ කෙරෙන්නේ අද ආධිපත්‍යයෙහි ඇති යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ය.

එසේ වුව ද අද ඒ සංස්කෘතික ආධිපත්‍යය හසුරවන එක් ආයතනයක් දැකිය හැකි නො වෙයි. මධ්‍යකාලීන යුරෝපයෙහි නම් දේශපාලන මෙන් ම සංස්කෘතික ආධිපත්‍යය ද පාප් වහන්සේ සතු වුවා පමණක් නොව දේශපාලන ආධිපත්‍යය සංස්කෘතික ආධිපත්‍යයට යට විය. එසේ වුවත් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යය රජුට හෝ පාර්ලිමේන්තුවට හිමි වුවත් එය දේශපාලන ආධිපත්‍යයට යටත් විය.

යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය ලෝක ආධිපත්‍යයට පත්වීමත් සමග එය එයටම හිමි ස්වාධීනත්වයක් ලබාගත්තේ ය. මධ්‍යකාලීන යුරෝපයෙහි කතෝලික සංස්කෘතිය අභියෝගයට ලක්කල මුස්ලිම් සංස්කෘතිය විය. එබැවින් මුස්ලිම් සංස්කෘතියට විරුද්ධව සංවිධිත ව කටයුතු කිරීමට ආයතනයක අවශ්‍යතාව විය. ඒ අවශ්‍යතාව පාප් වහන්සේගෙන් ඉටුවිණි. යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය යුරෝපයේ පමණක් නොව මුළු ලෝකයේ ම ආධිපත්‍යයට පත්වූයේ අනෙක් සියළු සංස්කෘතීන් යටපත් කරමිනි. ඉන්පසු කාලයක් යන තුරු යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය මෙහෙයවීමට නිල ආයතනයක් අවශ්‍ය නො වී ය.

යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යයෙහි නිල ආයතන වූ රජුට හා පසුව පාර්ලිමේන්තුවට නිල වශයෙන් මැදිහත් වී ක්‍රියාත්මක වීමට තරම් කිසිවක් නො වී ය. එහි ප්‍රතිඵලය වූයේ නිල ආයතනයක් නොමැතිව ම යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට ලෝ පුරා ආධිපත්‍යය පැතිරවීමට හැකි වීම ය. එසේ ආධිපත්‍යය පැතිරවීම සඳහා අවශ්‍ය මෙවලම් ඒ වන විට සකස් කෙරී තිබුණි. පාසල් හා විශ්වවිද්‍යාල ඉන් ප්‍රධාන ම විය.

අද එයට ජනමාධ්‍යය ද එකතු වී ඇත. ඒ අතර පිහිටුවා ගන්නා ලද ලන්ඩනයේ රාජකීය සංගමය වැනි විවිධ විද්‍යා සංගම්, කලා ආයතන, විචාර ගුරුකුල ආදිය විසින් ද සංස්කෘතිය සම්බන්ධයෙන් ප්‍රමිති නිර්මාණය කෙරෙයි. ඒ සියල්ලට ම ඊට ආවේනික වූ ස්වාධීනත්වයක් ලැබී ඇත. එපමණක් නොව ඇතැම් විට පෞද්ගලිකව කලාකරුවන්ට හා විද්‍යාඥයන්ට යම් ස්වාධීනත්වයක් හිමිවිණි. යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යයෙහි උච්ඡතම අවධියෙහි එසේ නිල ආයතනයක් නොමැතිව එහෙත් එයටම ආවේණික මෙවලම් සූක්ෂම ව යොදාගනිමින් පුද්ගලයන්ට ද යම් ස්වාධීනත්වයක් ලබා දෙමින් කටයුතු කිරීමට හැකි විය.

එහෙත් අද මේ තත්වය ක්‍රමයෙන් ඇතැම් අංශවල ක්‍රමයෙන් ගිළිහී යනු දක්නට හැකි වෙයි. නැවත වතාවක් යම් ප්‍රමාණයකට මුස්ලිම් සංස්කෘතිය යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට අභියෝගයක් වනු දක්නට හැකි ය. ඒ හේතුවෙන් යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි සංස්කෘතික ආධිපත්‍යය සඳහා නැවතත් ආයතනයක් පිහිටුවා ගැනීමේ අවශ්‍යතාව

© Prof. Nalin De Silva

පැන නැඟී ඇත. එහෙත් ඒ කෙසේ කරන්නේ ද යන්න පිළිබඳව පැහැදිළි අවබෝධයක් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි වෙසෙන්නන්ට ඇතැයි සිතිය නො හැකි ය.

අපි මේ යුරෝපීය විකාශය සිංහල බෞද්ධ සංස්කෘතිය සමග සංසන්දනය කරමු. සිංහල බෞද්ධ සංස්කෘතියෙහි ආරම්භයෙහි සිට ම සංස්කෘතික ආධිපත්‍යය භික්ෂූන් වහන්සේ සතුවිය. මෙයට සංස්කෘතික ආධිපත්‍යය යන්න සුදුසු නමක් නො වේ යැයි දැන් වැටහෙයි. භික්ෂූන් වහන්සේ ආධිපත්‍යයක් නො දැරූහ. උන්වහන්සේ රජුට හා ගිහියන්ට අනුශාසනය කළහ. එබැවින් සිංහල බෞද්ධ සංස්කෘතිය ගැන කතාකිරීමේ දී මින් මතු සංස්කෘතික අනුශාසකත්වය යන්න ද අනෙක් සංස්කෘතීන් සම්බන්ධයෙන් සංස්කෘතික ආධිපත්‍යය යන්න ද අපි භාවිතා කරමු.

මිහිඳු මහා රහතන් වහන්සේ මෙරටට වැඩම කිරීමට පෙර මෙරට අධ්‍යාපනය බමුණන් අතේ වූ බව පැහැදිළි ය. පණ්ඩුල බ්‍රාහ්මනයාගේ කතාව එයට නිදසුනක් වෙයි. පූජ්‍ය බද්දේගම විමලවංශ හිමියෝ තමන් වහන්සේගේ මතිමතාන්තර නම් කෘතියෙහි ඒ බව පැහැදිළි කළහ. උන්වහන්සේ පෙන්වා දී ඇත්තේ එවකට බමුණන් අත පැවති අධ්‍යාපනය මිහිඳු හිමියන්ගෙන් පසුව භික්ෂූන් අතට පත් වූ බව ය. එදා සිට බ්‍රිතාන්‍යීන් මෙරට අධ්‍යාපන දෙපාර්තමේන්තුවක් පිහිටුවා එහි ප්‍රධාන ධුරයට ඇංග්ලිකන් පූජකවරයකු පත්කර එංගලන්තයේ පාඩමාලා මෙරට පාසල්වලට ද බලයෙන් ඇතුළත් කරන තුරු මෙරට භික්ෂූන්වහන්සේ අධ්‍යාපනයෙහි මූලික කාර්යය ඉටු කළහ.

එපමණක් නොව සංස්කෘතික වශයෙන් රජුට අනුශාසනා කළෝ ද භික්ෂූන් වහන්සේ ය. අනුරාධපුර අටමස්ථානය පිහිටි ස්ථාන මිහිඳු මහා රහතන් වහන්සේ විසින් ඒ සඳහා නියම කරන ලදී. භික්ෂූන් වහන්සේගේ විහාර සම්බන්ධයෙන් රජුට තිබුණේ උපදෙස් පිළිපැදීම පමණ ය. භික්ෂූන් වහන්සේගේ පමණක් නොව ගිහියන්ගේ ද සංස්කෘතික කටයුතු සිදු කෙරුණේ භික්ෂූන් වහන්සේගේ අනුශාසකත්වයෙනි. එක්තරා ආකාරයකින් ගතහොත් මෙහි අනුශාසකත්වයකට වඩා මාර්ගෝපදේශකත්වයක් ද විය.

දේශපාලනයෙහි ද භික්ෂූන් වහන්සේ රජුට අනුශාසනය කළහ. එහෙත් එහි දී අවසන් තීරණය ගනු ලැබුයේ රජු විසිනි. එසේ වුවත් සංස්කෘතික කටයුතු සම්බන්ධයෙන් සියළු තීරණ භික්ෂූන් වහන්සේගේ අනුශාසකත්වයෙන් ගනු ලැබිණි. මෙවැනි තත්වයක් මධ්‍යකාලීන යුරෝපයෙහි හෝ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි හෝ නො වී ය. මධ්‍යකාලීන යුරෝපයෙහි පාප් වහන්සේ සංස්කෘතික වශයෙන් ද ආධිපත්‍යය ඉසුළූහ. එහෙත් පාප් වහන්සේ දේශපාලන වශයෙන් ද ආධිපත්‍යය දැරූහ. එහි බලය බෙදා හදා ගැනීමක් නො වී ය.

භික්ෂූන් වහන්සේ එසේ සංස්කෘතික වශයෙන් වෙන ම කේන්ද්‍රයක් ලෙස කටයුතු කෙළේ එක්සේසත් රාජ්‍යයක බව අවධාරණය කළ යුතු ය. එක්සේසත් රාජ්‍යයක් යනු බල කේන්ද්‍ර එකට ගොනු කළ රාජ්‍යයක් විය. ඒ බලය බෙදීමක් හෝ ප්‍රාදේශීය ව බලය තිබූ රාජ්‍ය කිහිපයක් එක් කිරීමක් හෝ නො වී ය. කලින් සඳහන් කර ඇති පරිදි ඒකීය රාජ්‍යයක ආපසු ගැනීමට හැකිවන අයුරින් බලය බෙදනුයේ ප්‍රන්තවලට ය. එහෙත් එක්සේසත් රාජ්‍යයෙහි සංස්කෘතික බලය හෙවත් අනුශාසකත්වය තිබුණේ ප්‍රාදේශීය ප්‍රාන්තවල වාසය කළ කිසිවකුට නොව අනුරාධපුරයෙහි ම නැතහොත් පසුව වෙනත් අගනුවරක වැඩ විසූ භික්ෂූන් වහන්සේ ට ය.

මිහිඳු මහා රහතන් වහන්සේ මහා විහාරය කරවුයේ ද ඇතුළු නුවරින් වඩා ඈත්වුත් ඇතුළු නුවරට වඩා සමීපවුත් තැනක නොවන බව පැහැදිළි කරගත යුතු ය. භික්ෂූන් වහන්සේට තිබූ සංස්කෘතික ස්වාධීනත්වයෙහි ප්‍රතිපලයක් ලෙස උන්වහන්සේ මෙරට සිංහල බෞද්ධ සංස්කෘතිය වර්ධනය කිරීමෙහි ලා ද පසුව ආරක්ෂාකිරීමෙහි ලා ද යම් යම් පියවර ගත්හ. එහි දී ප්‍රමුඛස්ථානය ලැබුනේ මහාවිහාරයට බව පැහැදිළි ය.

මේ සංස්කෘතික ස්වාධීනත්වය ක්‍රියාත්මක වූ එකම රාජ්‍යය සිංහල බෞද්ධ රාජ්‍යය විය හැකි ය. අප කලින් සඳහන් කළ වාරණ, විශේෂයෙන් ම මහායානයට එරෙහි ව පැන වූ වාරණ මේ සංස්කෘතික ස්වාධීනත්වය යටතෙහි ගත් පියවරවල ප්‍රතිඵල විය. අභයගිරිය ඇතැම් කරුණුවල දී ක්‍රියාකර ඇත්තේ සුළුවෙන් නමුත් අද බටහිර විවිධ මතවාදවලට කිසිම තහංචියක් නොමැතිව ඉඩ දෙන රාජ්‍ය නොවන ආයතන හා මෙරට පාසල් හා විශ්වවිද්‍යාල මෙනි.

© Prof. Nalin De Silva

අද විශ්වවිද්‍යාල හා පාසල් ක්‍රියාත්මක වන්නේ බටහිර සංස්කෘතික ආධිපත්‍යයට යටත්ව ය. රාජ්‍ය නොවන ආයතන ද බටහිර සංස්කෘතික හා දේශපාලන ආධිපත්‍යයෙහි නියෝජිත (වරලත්) ආයතන මෙන් ක්‍රියාකරයි.

අභයගිරිය එවැනි පහත් මට්ටමකට වැටුණි යැයි නො කියමි. එහෙත් එහි වැඩ විසූ භික්ෂූන් වහන්සේ දිගට ම ඒ අයුරින් කටයුතු කළෝ නම් මෙරට ථෙරවාදය අහෝසි වී මහායානයත් පසුව හින්දු ආගමත් ව්‍යාප්ත වීමට ඉඩ තිබුණි. මහාවිහාරික භික්ෂූන් වහන්සේ විවිධ ක්‍රියා මාර්ග අනුගමනය කරමින් එසේ වනු වැළැක්වීමට  සමත් වූහ. අද අපට කටයුතු මහාවිහාරික භික්ෂූන් වහන්සේ ගත් මග අනුගමනය කරමින් අද රාජ්‍ය නොවන සංවිධාන හා විශ්වවිද්‍යාල ඔස්සේ මෙරටට ලැබෙන රටට අහිතකර මතවාද පරාජය කිරීම අපේ වගකීම හා යුතුකම වෙයි.

කිරීමට සිදු වී ඇත්තේ එදා මහාවිහාරික භික්ෂූන් වහන්සේ කටයුතු කළ ආකාරයට ද වඩා තීව්‍ර ය. එදා අභයගිරියෙන් ඇති වූ තර්ජනයට වැඩි තර්ජනයක් අද වෙයි. අද අප ලෝක සංස්කෘතික යටත්විජිතවාදයකින් බැටකමු. ඒ අතර දේශපාලන හා ආර්ථිකව ද බටහිර ක්‍රිස්තියානි නූතනත්ව යටත්විජිතවාදයෙන් පීඩාවට ලක් වී සිටුමු. අවාසනාවකට අද අපට සංස්කෘතික ප්‍රතිපත්තියක් නැත. වාරණය කළ යුත්තේ කුමක් ද නොකළ යුත්තේ කුමක් ද යන්න පිළිබඳ අපට අවබෝධයක් නො වේ. රජයෙන් පත්කරන වාරණ මණ්ඩල ක්‍රියාත්මක වන්නේ ම දේශපාලන ආධිපත්‍යයකට යටත්ව හා බටහිර මතවාදවලට යටත් ව ය. වාරණ මණ්ඩලයක අදහස ම බටහිරින් ගත්තකි.  අපේ ම වූ වාරණ ක්‍රමයක් සකස් කර ගැනීමට සැලසුම් කිරීම සඳහා කාලය පැමිණ ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva